**කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - ප්‍රථම සෙමෙස්තරය - 2017/2018**

**SOC 2131 – සමාජ ප්‍රතිපත්ති සහ සමාජ සැලසුම්කරණය**

**පැ දෙකයි (02)**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න**

---

1. 'සමාජ ප්‍රතිපත්ති' සහ 'සමාජ සැලසුම්කරණය' යන සංකල්ප නිර්වචනය කොට, මේ සංකල්ප දෙක අතර ඇති අන්තර් සබඳතාවය යෝග්‍ය නිදර්ශන ඇසුරෙන් පැහැදිලි කරන්න.

2. 1977 නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීමෙන් පසුව දරිද්‍රතාවය පිටු දැකීම උදෙසා ශ්‍රී ලංකාව ප්‍රතිපත්තිමය වශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි, ශක්තීන් සහ සීමා යෝග්‍ය නිදසුන් සහිතව විස්තර කරන්න.

3. 'සංවර්ධනය යන්න ආර්ථික අංශයට පමණක් සීමා නොවෙමින් සමාජ, දේශපාලන සහ සංස්කෘතික යන සියලු මානයන්ගේ ධනාත්මක වර්ධනයක් වශයෙන් නිර්වචනය කළ හැකිය.' සංවර්ධනය පිළිබඳ න්‍යායයන් කෙරෙහි විශේෂ අවධානයක් සහිතව මෙම ප්‍රකාශය විභාග කරන්න.

4. ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රතිපත්ති වර්ධනය සඳහා සුභ සාධන රාජ්‍යය ක්‍රමය මගින් ඇති කරන ලද බලපෑම නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

5. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා බිහිකර ඇති අධ්‍යාපන ප්‍රතිපත්තීන්හි, සාධනීය තත්ත්වයන් සහ දුර්වලතා මොනවාදැයි විමසන්න.

6. 'සමාජ ප්‍රතිපත්තියක් යනු තනි පුද්ගලයාගේ මෙන්ම සමූහයකගේ සමාජයීය යහපැවැත්ම සහ සුභසාධනය අරමුණු කොට ගෙන බිහි වූවකි.' ශ්‍රී ලංකාවේ ඔබ කැමැති ඕනෑම සමාජ ප්‍රතිපත්තියක් ඇසුරෙන් මෙම ප්‍රකාශය විචාරපූර්වකව සාකච්ඡා කරන්න.

*******************